**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
**பொலிஸ் ஊடகப் பிரிவு**
**POLICE MEDIA DIVISION**
සුහුරුපාය, බත්තරමුල්ල


| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 2171635 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011- |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973 (HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1502/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 |
| දිනය<br>திக<br>Date | 23/09/2024<br>පැය 0530 | | |

# මාධ්‍ය නිවේදනය

## 01. වෙඩි තබා මනුෂ්‍ය ඝාතනය කිරීමට තැත් කිරීමක් - මාලිගාවත්ත පොලිස් වසම.

2024.09.22 වන දින රාත්‍රී කාලයේ මාලිගාවත්ත පොලිස් වසමේ ශ්‍රී සද්ධර්ම මාවත ප්‍රදේශයේදී යතුරු පැදියකින් පැමිණි බවට සැකකරන නාඳුනන පුද්ගලයෙකු විසින් නිවස ඉදිරිපිට රැඳී සිටි පුද්ගලයෙකුට වෙඩි තබා පලා ගොස් ඇති බවට මාලිගාවත්ත පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත. තුවාලකරු කොළඹ ජාතික රෝහලට ඇතුලත් කර ඇත.

**තුවාලකරු වයස අවුරුදු වයස අවුරුදු 52 ක් වූ මාලිගාවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා මාලිගාවත්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 02. දියේ ගිලී කුඩා දැරියක් මියයාමක් - මුලතිව් පොලිස් වසම.

2024.09.22 වන දින උදෑසන කාලයේ මුලතිව් පොලිස් වසමේ මුල්ලිවයික්කාල් නැගෙනහිර ප්‍රදේශයේ කුඩා දැරියක් මව සමඟ නාන කාමරයේ සිටියදී වතුර පිරවූ බේසමකට වැටී මාන්චෝල රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇති බවට මුලතිව් පොලිසියට ලද පැමිණිල්ලක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මියගිය දැරිය වයස මාස 11 ක් වන මුල්ලිවයික්කාල් නැගෙනහිර, මුලතිව් ප්‍රදේශයේ පදිංචි දැරියකි.**

මෘත ශරීරය මාංචෝලේ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මුලතිව් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - හොරොව්පොතාන පොලිස් වසම.

2024.09.22 වන දින උදෑසන කාලයේ හොරොව්පොතාන පොලිස් වසමේ පුත්තලම ත්‍රිකුණාමලය මාර්ගයේ මොරකැව වලව්ව ඉදිරිපිටදී පුත්තලම දෙස සිට ත්‍රිකුණාමලය දෙසට ධාවනය වූ කාර් රථයක් රියදුරුට පාලනය කර ගත නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන තල් ගසක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් කාර් රථයේ රියදුරු, ඉදිරි අසුනේ සිටි පුද්ගලයෙකු සහ පිටුපස සිටි පුද්ගලයන් දෙදෙනෙකු බරපතල තුවාල ලබා හොරොව්පොතාන රෝහලට ඇතුලත් කිරීමේදී ඉදිරිපස අසුනේ සිටි පුද්ගලයා මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 49 ක් වූ පත්තෑව, කපුගොල්ලෑව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තුවාලකරුවන් වැඩිදුර ප්‍රතිකාර සඳහා අනුරාධපුර රෝහල වෙත මාරු කර යවා ඇත. මෘත ශරීරය අනුරාධපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර, හොරොව්පොතාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**